# ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී පිළියෙල කළයුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරිව තිබූ පිරිවැය රු.673,651 ක් වූ ග්‍රන්ථ හා සඟරා වල වටිනාකම ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි.

#### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දක්වා ඇති විෂයයන් වලට අදාල සාක්ෂි විගණනයට ලබානොදීම නිසා එම විෂයයන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| බැංකු ශේෂය | 613,353 | ශේෂ සනාථ කිරීම් |
| ස්ථාවර තැන්පතු | 500,000 | ශේෂ සනාථ කිරීම් සහ ස්ථාවර තැන්පතු සහතික |
| කාර්යාල උපකරණ | 440,341 | ඉන්වෙන්ට්‍රි ලේඛන,<br>භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| ලිබඩු මෙවලම් | 7,725 | - එම - |

### 1.2.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ ) 1952 අංක 18 දරන කලා මණ්ඩල පනත | |
| (i) 10 (1) උප වගන්තිය | සෑම තුන් මසකටම වරක් මණ්ඩලයේ රැස්වීමක් පැවැත්විය යුතුවුවත්, 2012 වර්ෂයේ රැස්වීම් වාර 2 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ii) 18 (1) හා (2) උප වගන්ති | මුදල් වර්ෂයක් අවසානයේ වාර්ෂික වාර්තාවක් පිළියෙල කර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ ) **රජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මු.රෙ.168 | සමාලෝචිත වර්ෂයේදී රු.1,427,850 ක ලැබීම් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |
| (ii) මු.රෙ.231 (2) | ගෙවීම් පහසුවෙන් හඳුනාගත හැකි පරිදි ගෙවීමට අදාල සියලුම වැදගත් ලියවිලි හා උප වවුචර්, කුවිතාන්සි ගොනු සම්බන්ධය ගෙවීම් වවුචර් වල සඳහන් කර නොතිබුණි. |
| (iii ) මු.රෙ. 237 (අ ) | ප්‍රවර්තන වර්ෂයේදී මුද්‍රණය කරන ලද ග්‍රන්ථ නියමිත පිරිවිතරයට අනුව සැපයීම සිදුකර තිබුණු බවට නිර්දේශයක් හෝ සහතිකයක් නොමැතිව ඒවා මුද්‍රණය වෙනුවෙන් රු.538,600 ක් මුදල් ගෙවා තිබුණි. |
| (iv) මු.රෙ.264 (1) | ගෙවීම් වවුචර් සඳහා අදාල මුදල ආදායකයා ලබාගත් බවට කුවිතාන්සි මගින් තහවුරු කර නොතිබුණි. |

| | |
|---|---|
| (v) මු.රෙ. 371 (ඇ) | නිලධාරීන් 4 දෙනෙකු විසින් අවස්ථා 17 කදී ලබාගත් රු.309,000 ක අත්තිකාරම්වලින් ඉතිරි වූ රු.138,939 ක් පියවීම සඳහා දින 07 සිට දින 65 දක්වා කාල පරාසයක් ගතකර තිබුණි. |
| (vi) මු.රෙ.371 (2) (ආ) | අනු මණ්ඩල කමිටු 5 ක මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් නොවන අනු මණ්ඩල ලේකම්වරුන් වෙත අනු මණ්ඩල කමිටු රැස්වීම් පැවැත්වීමේ වියදම් සඳහා එකතුව රු.1,042,750 ක් 2012 වර්ෂය තුළදී ලබාදී තිබුණි. |
| (vii) මු.රෙ.751 (1) | මුද්‍රණය කරන ලද ග්‍රන්ථ හා සඟරා සඳහා ලේඛන විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| (ඇ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන චක්‍රලේඛය | රාජ්‍ය ආයතන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුන්වා දී තිබෙන මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ප්‍රතිඵල දැක්වෙන ප්‍රකාශන ආකෘති අනුව එම ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |

### 1.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

අනු මණ්ඩල කමිටු රැස්වීම් සඳහා අනු මණ්ඩල ලේකම්වරුන් සහ සහකාර ලේකම්වරුන් වෙත සමාලෝචිත වර්ෂයේදී රු.62,100 ක් ගෙවීම් කර තිබුණද, ඒ සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.465,600 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපව ඌනතාවය රු.202,772 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.262,828 ක අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ මෙහෙයුම් වියදම් රු.203,145 කින් වැඩිවීම හා ආදායම රු.59,685 කින් අඩුවීමය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

1982 අංක 18 දරන කලා මණ්ඩල පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව පිහිටුවනු ලැබූ අනු මණ්ඩල 5 න් 4 ක රැස්වීම් සඳහා එම අනු මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වය අඩු මට්ටමක පැවතුණි. රාජ්‍ය සංගීත අනු මණ්ඩල රැස්වීම සඳහා සෑම වාරයකදීම සාමාජික සහභාගීත්වය අඩකටත් වඩා අඩු මට්ටමක පැවතුණි.

3.2 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ ) 1952 අංක 18 දරන කලා මණ්ඩල පනතේ 13 (1 ) හා (2) වගන්ති මගින් එහි කාර්ය මණ්ඩලය පත්කර ගැනීම සඳහා විධිවිධාන සලසා තිබුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අගෝස්තු 26 දිනැති DMS/E3/53/4/311/1 දරන ලිපිය මගින් අනුමත තනතුරු පිළිබඳ දක්වා තිබුණද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු සහ කාර්යාල කාර්ය සහායක යන තනතුරු 2 සඳහා 2005 අගෝස්තු 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවාගෙන කාලය දීර්ඝ කිරීමකින් තොරව අඛණ්ඩව සේවයෙහි යොදවාගෙන තිබුණි. 2013 මැයි 31 තෙක් ඔවුන්ගේ තනතුරු ස්ථිර කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදයේ උපදෙස් පරිදි මණ්ඩලයේ දර්ශනය හා අරමුණු කරා ළඟා විය හැකි වන සේ වර්ෂ 3 කට අදාල වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 **ක්‍රියාකාරී සැලැස්ම**

2012 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති, වැඩ සටහන් හෝ ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබුණි.

4.3 **අයවැය ලේඛනමය පාලනය**

2012 වර්ෂය සඳහා කලා මණ්ඩලය විසින් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින් වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ ) කාර්ය මණ්ඩල බඳවා ගැනීම

(ආ) තොග පාලනය